*සැ. යු:-* 2024.10.11 දින පළකරන ලද අංක 2406 *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,407 - 2024 ඔක්තෝබර් මස 18 වැනි සිකුරාදා - 2024.10.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2560 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2568 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ඔක්තෝබර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2557- B 82619 — 5,403 (2024/10)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය ඃ**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඊ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2024

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම්:

i. අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

ii. පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, සහතික කරන්නාගේ නිල මුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.)

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුනකට (03) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(ලේකම්/ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතුය.)

***සටහන.***- මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. සේවා කාලය ආරම්භ වන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය.

iii. කායික යෝග්‍යතාවය

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iv. වෙනත් සුදුසුකම්
- ✓ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- ✓ අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- ✓ අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

3. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුලත බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් ආකාරයට පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ / රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය (නීති නිලධාරී) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

v. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

4. වයස් සීමාව :
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

5. වැටුප් පරිමාණය :
2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු.47,615-10×1,335-8×1,630-17×2,170- රු. 110,895/- (SL -1-2016) වේ.

6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 25 |
| | අ.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය; | 25 | |
| | ආ.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් ; | 20 | |
| | ඇ.) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගන්නා ලද, | | |
| | ✓ පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | ✓ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | ✓ පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | ✓ සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td></td><td>ඈ.) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය<br><br>සටහන.- නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.<br><br>(ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)</td><td>10<br>05</td><td></td></tr>
<tr><td>02</td><td>අතිරේක පළපුරුද්ද :<br><br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම් සඳහා<br><br>
<table>
<tr><th></th><th>නඩු ගොනු කිරීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th><th>අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</th></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>2</td><td>5</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>2</td><td>4</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>2</td><td>3</td></tr>
<tr><td>දිස්ත්‍රික් උසාවි</td><td>4</td><td>5</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>2</td><td>3</td></tr>
</table>
<br>සටහන :<br>ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.</td><td></td><td>35</td></tr>
<tr><td>03</td><td>තොරතුරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම<br><br>(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම ;<br><br>(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක් ;<br><br>(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ - 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්</td><td>10<br><br>08<br><br>05</td><td>10</td></tr>
</table>

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br><br>*(ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)* | 04 | |
| 04 | භාෂා හැකියාව :<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය | 15 | 15 |
| | (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවල දී (Moon court competition) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යාක්ත බව<br><br>කේවල :<br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාවය - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br>කණ්ඩායම් :<br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාවය - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>iii. තෙවන ස්ථානය / වෙනත් කුසලතා - 06 | 12 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF - 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින් /රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක් | 10 | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL - IBT 79 හෝ ඊට ඉහළ, TOEFL - CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL - PBT 550 හෝ ඊට ඉහළ වීම. | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්.<br><br>*(ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)* | 05 | |

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය ඃ<br><br>තනතුරෙහි භූමිකාව ඉටු කිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ:<br>✓ශක්තීන් (Strength questions)<br>✓අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) හා<br>✓දක්ෂතාවය (Competency questions)<br><br>*ඇගයීමට ලක් කිරීම අරමුණු කරගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ.* | <br><br><br>02<br>03<br>10 | 15 |
| | **එකතුව** | | **100** |

7. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය ඃ**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලු සහතිකපත්වල මුල් පිටපත් හා අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

8. **අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය ඃ**

i. අයදුම්පත් **2024.11.17** වැනි දිනට හෝ ඊට ප්‍රථම "සර්වේයර් ජනරාල්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, අංක 150, නාරාහේන්පිට, කොළඹ 05" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත් දෙවැනි පිටුව 05 සිට 07 දක්වාත් තෙවැනි පිටුව 08 සිට 09 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළකර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු.47,615/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

9. **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්<br>
කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර<br>
හා ජලජ සම්පත් අමාත්‍යාංශය.

2024 ඔක්තෝබර් මස 04 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේවන මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2024

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි.)

(අයදුම්කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

සිංහල - 2/ දෙමළ - 3/ ඉංග්‍රීසි - 4

***සටහන:-*** අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0

1.1 සම්පූර්ණ නම (මයා / මිය / මෙය) (සිංහලෙන් / දෙමළෙන්) :...........................................................................................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................................................

1.3 මුලකුරු සමඟ නම (මයා / මිය / මෙය) (සිංහලෙන් / දෙමළෙන්) :...........................................................................................
උදා : එම්.ජී.බී.එස්.කේ.ගුණවර්ධන

1.4 මුලකුරු සමඟ නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :...........................................................................................
උදා : GUNAWARDHANA, M.G.B.S.K.

2.0

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන් ) :……………………………………………………………………………………

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :……………………………………………………………………………………

3.0

3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 ☐ (අදාළ කොටුව තුළ ලියන්න.)

3.2 විවාහක / අවිවාහක බවඃ විවාහක - 1 අවිවාහක - 2 ☐ (අදාළ කොටුව තුළ ලියන්න.)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2024.11.17 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 දුරකථන අංකය : ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

5.0

5.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබාගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

| සුදුසුකම් ලබාගත් ආයතනය | ලබාගත් දිනය |
|---|---|
| ……………………………………………… | …………………………… |
| ……………………………………………… | …………………………… |

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය : ……………………………

*මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික / ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතිකකර අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තරඃ-

5.2 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :……………………………………………………………………………………
……………………………………………………………………………………
……………………………………………………………………………………

5.3 අතිරේක වෘත්තීය පළපුරුද්ද :……………………………………………………………………………………
……………………………………………………………………………………
……………………………………………………………………………………

5.4 තොරතුරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුමඃ…………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

5.5 භාෂා හැකියාව : :........................................................................................................
...........................................................................................................
...........................................................................................................

*අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම්කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

6.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදාළ කොටුවේ (✓) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න)

| ඔව් | | නැත | |
|---|---|---|---|

.................................................................................................................................................

7.0 අයදුම්කරුගේ සහතිකය :
මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලු කොටස් නිවැරදිව සම්පූර්ණකර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත්වන බවත් ප්‍රකාශ කරමි.

........................ ................................
දිනය අයදුම්කරුගේ අත්සන.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන .............................................................................. මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු / ඇය මා ඉදිරිපිට දී ........................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

........................ ................................
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

සම්පූර්ණ නම :————.
තනතුර :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය: (රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා පමණි.)
ඉහත විස්තර සඳහන් ................................. මහතා /මහත්මිය / මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු / ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට / ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.................................,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

10-130

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඉඩම් මැනුම් සභාව

### ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය සඳහා, ප්‍රායෝගික පළපුරුද්ද ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා අයදුම්පත් කැඳවීම

2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වගන්තිය අනුව ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික පළපුරුද්ද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ලබාදීමට කටයුතු සැලසුම්කර ඇත. ඒ අනුව එම ප්‍රායෝගික පළපුරුද්ද ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ගේ තොරතුරු ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට ඉඩම් මැනුම් සභාව තීරණය කර ඇත.

ඒ අනුව එකී මැනුම් පනතේ 39 වගන්තිය හා එක්ව කියවිය යුතු උපලේඛනයේ (අ) කොටසෙහි සඳහන් ශාස්ත්‍රීය සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්ට මේ සඳහා අයදුම්කළ හැකි අතර ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරුවරුන් ලෙස දැනටමත් පුහුණුව ලබන තැනැත්තන්ට මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

සියලු අයදුම්කරුවන් www.landsurveycouncil.org දරන ඉඩම් මැනුම් සභාවේ නිල වෙබ් අඩවියට ඇතුළත් කර තිබෙන අයදුම්පත මගින් මාර්ගගත ක්‍රමය ඔස්සේ තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එකී අයදුම්පත්‍රයෙහි බාගත කර ගන්නා ලද දෘඪ පිටපතක් **2024.11.18** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ''ලේකම්, ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150, බර්නාඩ් සොයිසා මාවත, (කිරුල පාර), කොළඹ 05.'' යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමුකළ යුතුය.

ඩබ්ලිව්. සුදත් එල්. සී. පෙරේරා,<br>
සභාපති,<br>
ඉඩම් මැනුම් සභාව.

2024 ඔක්තෝබර් මස 10 වැනි දින,<br>
කොළඹ 05, බර්නාඩ් සොයිසා මාවත,<br>
අංක 150, සර්වේයර් ජනරාල් කාර්යාලය,<br>
ඉඩම් මැනුම් සභාවේ දී ය.

10-157

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ විභාග දත්ත සහකාර තනතුරේ (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන- ඛණ්ඩ 2 සේවා ගණයේ විභාග දත්ත සහකාර (දෙපාර්තමේන්තුගත) - III ශ්‍රේණියේ තනතුර සඳහා පවත්නා පුරප්පාඩු **20ක්** පිරවීම සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

***සටහන.***- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් "රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම" යටතේ නිකුත් කරන ලද අංක MPS/HRD/HR03Recru.Process/2022/06 හා 2023.01.03 දිනැති ලිපිය මගින් මෙම බඳවාගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇත.

01. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් **2024.10.21 වැනි දින පැය 09.00 සිට 2024.11.19 වැනි දින පැය 21.00 දක්වා යොමු කළ හැකි වේ.** අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණක් වන අතර, අන් අයුරකින් ඉදිරිපත් කරන අයදුම්පත් භාරගනු නොලැබේ.

1.1. දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

1.2 මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව **2025 ජනවාරි මස කොළඹ දී** පමණක් පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්වරයාට බලය ඇත.

02. *සුදුසුකම්:-*

2.1 *අධ්‍යාපන සුදුසුකම් :*

i. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සා.පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂය හැර) සමත් වී තිබීම.

2.2 *වෘත්තීය සුදුසුකම් :*

අවම වශයෙන් පරිගණක / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 3 මට්ටම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකම් ලබා තිබීම.

2.3 *පළපුරුද්ද :*

පරිගණක දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සම්බන්ධ මාස 06ක පළපුරුද්ද

2.4 *කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත වීම මෙන්ම සේවයේ අවශ්‍යතාව මත දිවා රාත්‍රී සේවය කිරීමේ හැකියාව ද අපේක්ෂා කෙරේ.

2.5 *වෙනත් සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;

ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය;

iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට **(2024.11.19)** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය;

iv. කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිම තැනැත්තකුට මෙම තරග විභාගය සඳහා අයදුම්කිරීමට හෝ පෙනී සිටීමට අවසර නොමැත.

2.6 *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව 2006.11.19 දින හෝ ඊට පෙර හා 1989.11.19 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

03. *භාෂා මාධ්‍යය :-* මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩදෙනු නොලැබේ. තවද ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමවේදය :-* ලිඛිත විභාගයෙන්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් අපේක්ෂකයින් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව තනතුරට බඳවාගනු ලැබේ.

4.1. *ලිඛිත විභාගය :*

| *විෂයය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. පරිගණක සාක්ෂරතාව | පැය 2 | 100 | 40% |

*විෂය නිර්දේශය :-*

1. පරිගණක සාක්ෂරතාව-පරිගණක / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 3 මට්ටමේ විෂය ක්ෂේත්‍රයට අදාළ දැනුම පිළිබඳ විමසා බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

*සටහන.-* ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍රයට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ විභාග අංක / අකාරාදී අනුපිළිවෙළට ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

*4.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

මෙහි දී අපේක්ෂකයාගේ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රායෝගික කුසලතා පරීක්ෂා කරනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ. |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 | |
| මුළු ලකුණු | 70 | |

*සටහන.-* ඉහත වගුවෙ හි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයක් ඇතුළත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කරනු ඇත.

4.3. *ප්‍රායෝගික පරීක්ෂණය* :

| *පරීක්ෂණයට භාජනය කරනු ලබන කාර්යයන්* | *ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| දෙන ලද ලිපියේ ආකාරයට ම අදාළ මුද්‍රිත පිටපත ලබා ගැනීම | 10 |
| යතුරු ලියනයට හා අදාළ මුද්‍රිත පිටපත ලබාගැනීමට ගතවන කාලය | 10 |
| එහි නිවැරදි අක්ෂර වින්‍යාසය වෙනුවෙන් | 10 |
| මුළු ලකුණු | 30 |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ගේ යතුරු ලියන හැකියාව පරීක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ. එහි දී ඡේද කිහිපයකින් යුත් දෙන ලද ලේඛනයක් නියමකර ගත් නිශ්චිත කාලයක් තුළ පරිගණකය මගින් යතුරුලියනය කර එහි මුද්‍රිත පිටපතක් ලබා ගැනීම පරීක්ෂා කරනු ලැබේ.

4.4. ලිඛිත විභාගයෙන්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව තනතුරට බඳවාගනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ. වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරුට පත් වී වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. එම කාලය තුළ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක මට්ටමට වඩා ඉහළ පැවතීම හා අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරා ඇත්නම් නියමිත තනතුරේ ස්ථිර කරනු ලැබේ.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත් වීමට පෙර සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබාගත යුතුය.

iv. මෙම තනතුර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට ම සීමා වූ සේවාවකි. එසේ වුවද දෙපාර්තමේන්තුව තුළ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත් කරනු ලැබිය හැකිය. සේවා අවශ්‍යතාව මත දිවා රාත්‍රී වැඩමුර දිගට ම පවතින බැවින් අදාළ පත්වීම භාරගත් පසු ඒ අනුව කටයුතු කිරීම අනිවාර්ය වේ.

v. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, යටත් විය යුතුය.

06. ***ප්‍රතිඵල නිකුත් කිරීම.-*** විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් තැපෑලෙන් හෝ **www.results.exams.gov.lk** වෙබ් අඩවිය මගින් හෝ සිදු කරනු ලැබේ.

07. ***වැටුප් පරිමාණය (මාසික).-*** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN-01-2016 යටතේ රු. 27,140 - 10× 300 - 11× 350 - 10× 495 - 10× 660 - රු. 45540/-

08. *උසස් කිරීමේ පරිපාටිය.-* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ විභාග දත්ත සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අදාළ වේ.

09. ***අයදුම් කිරීමේ ක්‍රමය*** :

i. අයදුම්පත් භාර ගන්නේ මාර්ගගතව පමණි. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත භාරගන්නා ලද බව / භාර නොගන්නා බව ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් පසුව කරනු ලබන විමසීම්වල දී ඉදිරිපත් කිරීමට ළඟ තබා ගත යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මාර්ගගත පද්ධතියේ ඇති තොරතුරු නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. අයදුම්කරු විසින් විභාග ගාස්තු වශයෙන් රු. 600ක මුදලක් ගෙවිය යුතුය. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Bank Debit Card with Internet Payment Facility)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Bank of Ceylon Online Banking Bill Payment Method)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon any Branch)

*සටහන* :- ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට ආදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

iii. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

iv. විභාගය සඳහා ගෙවන ලද මුදල් කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

v. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළකරනු ලබන අතර අයදුම්කරු වෙත කෙටි පණිවුඩයක් (SMS) හා විද්‍යුත් තැපැල මගින් දැනුම් දීමට කටයුතු කෙරේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක්, දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

vi. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

vii. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ලිඛිත විභාගයේදී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

* ජාතික හැඳුනුම්පත ;
* වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
* වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සහ විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදුවනු ඇත.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

2024 ඔක්තෝබර් මස 18 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

10-173

**පරිසර, වනජීවි, වනසම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය - අතුරුගිරිය

**සහකාර වතු අධිකාරී පුහුණු පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම**

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 අංක 45 දරන පාර්ලිමේන්තු පනත මගින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධ ව ස්ථාපිත කොට ඇති අතර වැවිලි ක්ෂේත්‍රයෙ හි නියුතුවන්නන්ගේ හා නියැලීමට උනන්දුවක් දක්වන පාර්ශව සඳහා අධ්‍යයන සහ වෘත්තීය සුදුසුකම් ඉහළ නැංවීම අරමුණු කොට ගනිමින් මෙරට තුළ ස්ථාපිත එකම රාජ්‍ය ආයතනය වේ.

2024/2025 අධ්‍යයන වර්ෂය සඳහා පහත සඳහන් පාඨමාලාව සඳහා උසස්පෙළ සමත් සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. INDUCTION PROGRAMME IN PLANTATION MANAGEMENT AND TECHNOLOGY (IPPMT) - PLANTER TRAINEE PROGRAMME (සහකාර වතු අධිකාරී පුහුණු පාඨමාලාව)

| | | |
|---|---|---|
| කාලසීමාව | - | අවුරුදු එකකි. (01) |
| | - | අදියර I - මාස 06 ක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාව |
| | | අදියර II - මාස 06 ක වතු ආශ්‍රිත ප්‍රායෝගික පුහුණුව |
| මාධ්‍යය | - | ඉංග්‍රීසි |
| පාඨමාලා ගාස්තුව | - | අදියර I සඳහා රු. 450,000.00 (නේවාසික පහසුකම් සමඟ) |
| වයස් සීමාව | - | උපරිම වයස් සීමාව අවුරුදු 22 |

**ඇතුළත් වීමේ සුදුසුකම් :**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව යන විෂයන් තුනට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම;

*හා*

අ.පො.ස. (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනක් (03) සමත් වීම.

*හෝ*

කෘෂිකර්මය පිළිබඳ පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම.

**අයදුම් කරන ආකාරය :**

මෙම පාඨමාලා සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024 ඔක්තෝබර් මස 30 වැනි** දිනට හෝ ඊට පෙර පහත දක්වා ඇති ආකෘතිය අනුව අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය, ශ්‍රී ලංකාව යන ලිපිනයට එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් හෝ www.nipm.gov.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව හෝ අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

වැඩිදුර විස්තර සඳහා :
011-2770232 074-0801966

FM/TR/03

# NATIONAL INSTITUTE OF PLANTATION MANAGEMENT

## APPLICATION FOR ADMISSION

**Name of the Programme :**

**Name in Full : Mr. / Mrs. / Miss. / Dr. / Prof. ( Use BLOCK LETTERS) :**

**Name with initials :**

**Permanent address :**

**Employer :**

**Designation :**

**Tele. No. :**

**Mobile No. :**

**Official address :**

**E-mail :**

**National Identity card No. :**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**Tele. No. :**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**Marital status**

Single ☐
Married ☐

**Date of birth**

| Date | | Month | | Year | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**Fax No. :**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

**EDUCATIONAL QUALIFICATIONS :**

**G.C.E (O/L) Examination :**

| Subject | Grade | Year |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

**G.C.E (A/L) Examination :**

| Subject | Grade | Year |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**COURSE COMPLETED AT THE NIPM :**

| Course | Year |
|---|---|
| | |
| | |
| | |

**PROFESSIONAL QUALIFICATIONS :**

| Institute | Period | Qualification | Year |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**WORK EXPERIENCE :**

| Organization | Period | Designation | Year |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

**FINANCE :**

How will you finance your professional studies at the institute?

Self ☐ Sponsored ☐

If sponsored, by whom ?

............................................ ............................................

Date Signature of the Sponsor

I hereby certify that the particulars furnished by me in this application are true & accurate and agree to abide by the rules and regulations governing the above course.

............................................ ............................................

Date Signature of the Applicant

**Payments Procedure for the programmes**

Payments can be made to the credit of NIPM Current Account No. 3697566 maintain at any branch of Bank of Ceylon ( BOC) and the printed "Customer Deposit Slip" should be forwarded to NIPM, Athurugiriya in order to obtain official receipt for payment. ( Name to be written in bank deposit slip for identification of the payee)

10-174

---

සංශෝධනයයි

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන ශ්‍රේණියේ නිලධාරීන් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට පත් කරනු ලැබූ නිලධාරීන් විසින් විභාගය සඳහා පෙනී සිටිය යුතු ය.)**

උක්ත මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024.09.13 දිනැති *ගැසට්* පත්‍රයේ පළකරන ලද *ගැසට්* නිවේදනයේ ඡේද අංක 05 හි අවසන් වාක්‍යය වන "***ගැසට්*** **නිවේදනය පළවන දිනට පසුව එළඹෙන සඳුදා දින මාර්ගගත අයදුම්පත් භාර ගැනීම ආරම්භ වේ.**" යන කොටස මෙයින් ඉවත් කරන අතර, ඡේද අංක 07 යටතේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024 ඔක්තෝබර් මස 30** වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

02. මෙහි සඳහන් අනෙකුත් කරුණු එලෙසින් ම බලපැවැත්වනු ඇත.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
ලේකම්,
අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, විද්‍යා සහ
තාක්ෂණ අමාත්‍යාංශයේ දී ය.

10-196/1

සංශෝධනයයි

අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024 (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන ශ්‍රේණියේ නිලධාරීන් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරීන් විසින් විභාගය සඳහා පෙනී සිටිය යුතු ය.)**

උක්ත මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024.09.13 දිනැති *ගැසට්* පත්‍රයේ පළකරන ලද *ගැසට්* නිවේදනයේ ඡේද අංක 05 හි අවසන් වාක්‍යය වන "***ගැසට්*** **නිවේදනය පළවන දිනට පසුව එළඹෙන සඳුදා දින මාර්ගගත අයදුම්පත් භාර ගැනීම ආරම්භ වේ.**" යන කොටස මෙයින් ඉවත් කරන අතර, ඡේද අංක 07 යටතේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024 ඔක්තෝබර් මස 30** වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

02. මෙහි සඳහන් අනෙකුත් කරුණු එලෙසින් ම බලපැවැත්වනු ඇත.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
ලේකම්,
අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, විද්‍යා සහ
තාක්ෂණ අමාත්‍යාංශයේ දී ය.

10-196/2

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ජාතික නැටුම්/ සංගීත විභාගය - 2024

උක්ත විභාගය **2024 දෙසැම්බර් මස** පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විතය. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ ප්‍රධාන විෂයය සඳහා වන අතර, ප්‍රයෝගික පරීක්ෂණය ප්‍රධාන විෂයය සහ අනුවිෂයය යන දෙකට ම පවත්වනු ලැබේ.

02. අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක ම විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවකදී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කර අදාළ අයදුම්කරුවන් යාබද විභාග මධ්‍යස්ථාන පිහිටි නගරය වෙත යොමු කිරීමට සිදුවනු ඇත. 5.6 ඡේදයේ සඳහන් නගරවල මෙම විභාගය පැවැත්වේ.

03. විභාගය පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි.

04. මෙම විභාගය පරිගණකගත දත්ත මත මෙහෙයවන විභාගයක් බැවින්, අයදුම්පත් පහත දැක්වෙන ආකෘතියට අනුකූලව A-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම භාවිත කරමින්, පිළියෙල කර ඇමුණුම 01 හා ඇමුණුම 02 පදනම් කර ගනිමින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. දී ඇති උපදෙස් පරිදි ප්‍රධාන විෂයයට අනුකූල නොවන අනුවිෂයයන් තෝරා ගැනීමෙන් වැළකී සිටිය යුතු ය. එසේ නොවන අයදුම්පත්, ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රධාන විෂයය හා අනුවිෂයය අනුව ඇගයීම් මණ්ඩලවලට අයදුම්කරුවන් යොමු කරන බැවින් ප්‍රාරම්භ අනුවිෂයය හැර පසුව අනෙක් කිසිදු විෂයයක් මාරු කිරීම සඳහා අවස්ථාව දෙනු නොලැබේ. (ඇමුණුම 01 සහ ඇමුණුම 02 බලන්න).

05. අයදුම්කරුවන්ට උපදෙස් :

5.1 *සුදුසුකම්* - සෑම අයදුම්කරුවකු ම පහත සඳහන් විභාග අතරින් එකක දී සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය.

(*අ*) අ.පො.ස (සා/පෙළ) විභාගය;
(*ආ*) ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය;
(*ඇ*) මූලික පිරිවෙන් අවසන් විභාගය/ පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය.

ඉහත විභාගවලට සමාන හෝ ඉහළ මට්ටමේ හෝ පිළිගත් වෙනත් විභාගයකින් සිංහල භාෂාව විෂය සඳහා සාමාර්ථය ලබා ඇත්නම් එය ද වලංගු වේ.

*සැ. යු.* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, 5.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති සෑම අයදුම්කරුවකුම මෙම විභාගයේ දී සිංහල භාෂාව විෂයය ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතු ය. නැටුම් විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් ශාස්ත්‍රීය අවබෝධය (නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම) ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිටිය යුතු ය.

5.2 *වයස් සීමාව* - **2024.12.31 වැනි දිනට** වයස අවුරුදු 15 සම්පූර්ණ විය යුතු අතර, අත්සන සහතික කරන බලධාරියා ලවා උප්පැන්න සහතිකය පරීක්ෂා කරවා නිරවද්‍යතාව සහතික කිරීමට වග බලා ගත යුතු ය. නියමිත වයස් සීමාව සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

5.3 *අයදුම්පත්* - ව්‍යවස්ථා සංග්‍රහයට අනුව, ප්‍රාරම්භ පරීක්ෂණයේ දී තෝරා ගන්නා ගණය (ප්‍රධාන විෂයය හා ඊට අනුකූල අනුවිෂයය) මධ්‍යම හා අවසාන පරීක්ෂණය සඳහා ද යෙදේ. අයදුම්කරුවන් ප්‍රාරම්භ පරීක්ෂණයේ දී තෝරාගත් ගණය හෝ එම ගණයට අයත් තෝරාගත් විෂයයන් හෝ මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා වෙනස් කළ නොහැකිය. එසේ කරනු ලබන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. ප්‍රාරම්භ පරීක්ෂණයේ ප්‍රධාන විෂයයට අනුකූල වන පරිදි අනුවිෂයය ද තෝරා ගැනීම කෙරෙහි අයදුම්කරුවන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.11.18** වැනි දිනට හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ජාතික නැටුම්/ සංගීත විභාගය - 2024" යනුවෙන් සඳහන් කළ යුතු ය.

5.5 අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පෙනී සිටිය යුතු විෂයයන් හා අනෙකුත් විස්තර සඳහා අදාළ ව්‍යවස්ථා හා නිර්දේශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ප්‍රධාන විෂයය හා අනුවිෂයය සඳහා විවිධ වූ විෂය අංක භාවිතා වන බැවින් ඉහත 5.3හි සඳහන් නියමයන් පිළිබඳව මනා අවධානයෙන් හා සැලකිල්ලෙන් යුතු ව ඇමුණුම 01 හා 02 පරිශීලනය කරමින් ඉතා නිවැරදිව අයදුම්පත් සම්පූර්ණ කළ යුතු බව අවධාරණය කරමි. තව ද ආදර්ශ අයදුම්පතේ අංක 01 සිට 09 තෙක් පළමු වන පිටුවට ද ඉතිරිය 02 වන පිටුවට ද ලෙස, A - 4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කළ යුතු වේ. ආදර්ශ අයදුම්පත දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ද (www.doenets.lk) බාගත කළ හැකි ය.

5.6 විභාගය පැවැත්වෙන නගර සහ ඊට අදාළ අංක පහත දැක්වේ :

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | කිලිනොච්චිය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මහනුවර | 04 | ත්‍රිකුණාමලය | 17 |
| මාතලේ | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | පුත්තලම | 19 |
| ගාල්ල | 07 | අනුරාධපුරය | 20 |
| මාතර | 08 | පොළොන්නරුව | 21 |
| හම්බන්තොට | 09 | බදුල්ල | 22 |
| යාපනය | 10 | මොනරාගල | 23 |
| මන්නාරම | 11 | රත්නපුර | 24 |
| වවුනියාව | 12 | කෑගල්ල | 25 |
| මුලතිව් | 13 | | |

5.7 *විභාග ගාස්තු* - ලිඛිත විභාගය සඳහා විභාග ගාස්තු පහත සඳහන් පරිදි වේ.

- ප්‍රාරම්භ - රු. 300.00
- මධ්‍යම - රු. 400.00
- අවසාන - රු. 500.00

අදාළ විභාග ගාස්තු "විභාග කොමසාරිස් ජනරාල්" නමින් දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි අතර, එසේ අයදුම්කරුගේ නමින්ම මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතු ය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු නොගෙවන අතර, එම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකි ය. නියමිත ගාස්තු ගෙවා නැති අයදුම්පත් හා මුද්දර, මුදල් ඇණවුම් සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලදුපතේ හා අයදුම්පතේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.8 *ප්‍රවේශ පත්‍ර* - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 හෝ 03 ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහිදී ඔබ වෙත තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද ළඟ තබාගෙන ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ඉල්ලුම් කරන ලද විභාගය සඳහන් කරමින් විමසා සිටිය යුතු ය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් හා ඉහත සඳහන් ලේඛනවල පිටපත් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වේ.

5.9 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ අයදුම්කරුවන් විසින් සපයා ගත යුතු ය.

5.10 *විෂය නිර්දේශය* : දනුම මැනීමට අපේක්ෂිත විෂය නිර්දේශය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් (www.doenest.lk) බාගත කර ගැනීමට අවස්ථාව සලසා ඇත.

5.11 කිසියම් අයදුම්කරුවකු වෙත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අදාළ අයදුම්කරු විභාගය සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කිරීමක් නොවේ. අයදුම්කරු සපයා ඇති තොරතුරු සාවද්‍ය බව හැඟී ගියහොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ. කිසියම් විභාග අපේක්ෂකයකු විභාගය සමත්වීම සඳහා ප්‍රධාන විෂයය සඳහා අවම වශයෙන් 40% ක් බැගින් ද ලබා ගත යුතු ය.

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර,
විභාග කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 09 වැනි දින,
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
පැලවත්ත, බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**ජාතික නැටුම්/ සංගීත විභාගය - 2024**

| නැටුම් |
|---|

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P මධ්‍යම - M අවසාන - F
(අදාළ පරිදි කොටුව තුළ ලියන්න)

අකුරින් [ ]

ඉංග්‍රීසි සංකේත අක්ෂරය [ ]

| ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්) | එහි අංකය |
|---|---|
| | |

1. (අ) සම්පූර්ණ නම

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

උදා : HERATH MUDALIGE SUPUN PERERA ⟶ PERERA, H.M.S. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

| |
|---|
| |

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න)

2. ස්ථිර ලිපිනය -

| |
|---|
| |
| |
| |
| (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) |

3. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී - 1, පුරුෂ - 0 [ ]

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

4. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

5. ඉල්ලුම් කරන විෂයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට්* නිවේදනයේ ඇමුණුම 01 බලන්න.)

| ප්‍රධාන විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

| අනු විෂයයේ නම | විෂය අංකය |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම්, අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(*ගැසට්* නිවේදනයේ 05 වන ඡේදය බලන්න.) [ ]

7. ජංගම දුරකථන අංකය ඃ

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

වට්ස්ඇප් අංකය ඃ
(Whatsapp No.)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

8. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර ඃ-

| | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

9. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථ්‍ය ලැබූ විභාගය පිළිබඳ විස්තර

1. වර්ෂය ඃ- [ ] 2. විභාග අංකය ඃ- [ ]

3. ඌන සාමාර්ථ්‍ය ලත්* විභාගය ඃ- [ ]

4. ඌන සාමාර්ථ්‍ය ලත්* අනු විෂයය ඃ- [ ] 2. විෂය අංකය ඃ- [ ]

(මෙහි ඇතුළත් ඇමුණුම 01 ලේඛනයේ සඳහන් විෂය අංකයම සඳහන් කරන්න. ඌන සාමාර්ථය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

* ඌන සාමාර්ථය ලත් අයදුම්කරුවන් යනු පසුගිය වර්ෂයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයය සමත් වී අනු විෂයය අසමත් වූ අයදුම්කරුවන් පමණක් වේ.

10.(අ) උපන් දිනය ඃ

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(ආ) 2024.12.31 වැනි දිනට වයස :-

| අවුරුදු : | | | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

11. ගෙවන ලද විභාග ගාස්තු (වචනයෙන්) රු. ..................................................................................

(ඉලක්කමෙන්) රු. ..............................................................................

විභාග ගාස්තු ගෙවූ තැපැල්/ උප තැපැල් කාර්යාලය : ..............................................................................

තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :- ..............................................................................

දිනය : ..............................................................................

(මුද්දර හා මුදල් ඇණවුම් අලවා එවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

12. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

| කුවිතාන්සිය මෙහි අලවන්න. |
|---|

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

අයදුම්පතෙහි සඳහන් කර ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

.............................................................................. ..............................................................................

දිනය. අයදුම්කරුගේ අත්සන,

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.**

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු/අයදුම්කාරිය .......................................................................... දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් තබන ලද බව ද ඔහුගේ/ ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය ................................................ බව ද උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ/ ඇයගේ උපන් දිනය ................................................... බව ද අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15ට වැඩි බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :- ..............................................................................

තරාතිරම :- ..............................................................................

(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)

ලිපිනය :-..............................................................................

දිනය : .............................................. ..............................................................................

අත්සන සහතික කරන අයගේ අත්සන

***සැලකිය යුතුයි.*** (අයදුම්කරුගේ අත්සන අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයකු විසින් හෝ සහතික කළ හැකි ය.

ඇමුණුම 01

**ජාතික නැටුම් විභාගය - 2024**

නැටුම් විෂය ලේඛනය හා විෂය අංක

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| (අ) ප්‍රධාන විෂයය | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| නැටුම් | | | |
| සබරගමු නැටුම් | 110 | 210 | 310 |
| පහතරට නැටුම් | 120 | 220 | 320 |
| උඩරට නැටුම් | 130 | 230 | 330 |
| බෙර වාදනය | | | |
| පහතරට බෙර වාදනය | 140 | 240 | 340 |
| උඩරට බෙර වාදනය | 150 | 250 | 350 |

| (ආ) (අනු විෂයය) | | | |
|---|---|---|---|
| සංගීතය | 112 | 212 | 312 |
| බෙර වාදනය | | | |
| සබරගමු දවුල් වාදනය | 113 | 213 | 313 |
| පහතරට බෙර වාදනය | 141 | 241 | 341 |
| උඩරට බෙර වාදනය | 151 | 251 | 351 |
| ජන ගායනා | 114 | 214 | 314 |
| භාරතීය නැටුම් | | | |
| කථක් | 115 | 215 | 315 |
| කථකලි | 116 | 216 | 316 |
| මනිපුරි | 117 | 217 | 317 |
| භරත | 118 | 218 | 318 |
| සාම්ප්‍රදායික නැටුම් | | | |
| සබරගමු නැටුම් | 111 | 211 | 311 |
| පහතරට නැටුම් | 121 | 221 | 321 |
| උඩරට නැටුම් | 131 | 231 | 331 |
| නිර්මාණ | 119 | 219 | 319 |
| ශාස්ත්‍රීය අවබෝධය | | | |
| නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම | 122 | 222 | 322 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 | | |

ප්‍රධාන විෂයට අනුකූල නොවන අනුවිෂය ලේඛනය
(මෙම විෂයයන් තෝරා ගැනීමෙන් වැළකිය යුතුය.)

| **ප්‍රධාන විෂය හා විෂය අංකය** | | **අනුවිෂය හා විෂය අංකය** | |
|---|---|---|---|
| සබරගමු නැටුම් | 110/210/310 | සබරගමු නැටුම් | 111/211/311 |
| පහතරට නැටුම් | 120/220/320 | පහතරට නැටුම් | 121/221/321 |
| උඩරට නැටුම් | 130/230/330 | උඩරට නැටුම් | 131/231/331 |
| පහතරට බෙර වාදනය | 140/240/340 | පහතරට බෙර වාදනය | 141/241/341 |
| උඩරට බෙර වාදනය | 150/250/350 | උඩරට බෙර වාදනය | 151/251/351 |

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ජාතික සංගීත විභාගය - 2024

**සංගීත**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P මධ්‍යම - M අවසාන - F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින්

ඉංග්‍රීසි සංකේත අක්ෂරය

| ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්) | එහි අංකය |
|---|---|
| | |

1. (අ) සම්පූර්ණ නම

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොදා
මුලකුරු සමග නම:

උදා : HERATH MUDALIGE SUPUN PERERA → PERERA, H. M. S. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :-

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම් කරන විෂයයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට් නිවේදනයේ ඇමුණුම 01 බලන්න.*)

| *ප්‍රධාන විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

| *අනු විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න. (*ගැසට්* නිවේදනයේ 05 වන ඡේදය බලන්න).) [ ]

7. ජංගම දුරකතන අංකය : [ | | | | | | | | | ]

8. වට්ස්ඇප් අංකය : (Whatspp No.) [ | | | | | | | | | ]

8. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර -

| | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

9. ඌන සාමාර්ථ්‍ය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථ ලැබූ විභාගය පිළිබඳ විස්තර :

1. වර්ෂය :- [ ] 2. විභාග අංකය :- [ ]

3. ඌන සාමාර්ථ ලත් *විභාගය :- [ ]

4. ඌන සාමාර්ථ්‍ය ලත් *අනු විෂයය :- [ ] විෂයය අංකය :- [ ]

(මෙහි ඇතුළත් ඇමුණුම 01 ලේඛනයේ සඳහන් විෂය අංකයම සඳහන් කරන්න. ඌන සාමාර්ථ්‍ය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

*ඌන සාමාර්ථ්‍ය ලත් අයදුම්කරුවන් යනු පසුගිය වර්ෂයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයය සමත් වී අනු විෂයය අසමත් වූ අයදුම්කරුවන් පමණක් වේ.

10. (අ) උපන් දිනය :-
වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(ආ) 2024.12.31 වන දිනට වයස :-

අවුරුදු [ | | | ] මාස [ | ] දින [ | ]

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

11. ගෙවන ලද විභාග ගාස්තු (වචනයෙන්) රු. .....................................................

(ඉලක්කමෙන් රු. ........................................)

විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :- ...............................................
තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :- .............................................
දිනය : .....................................

(මුද්දර හා මුදල් ඇණවුම් අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

12. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

| |
|---|
| කුවිතාන්සිය මෙහි අලවන්න. |

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබා ගන්න.)

අයදුම්පතෙහි සඳහන් කර ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

............................................ ..............................................
දිනය අයදුම්කරුගේ අත්සන.

**<u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>**

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු/ අයදුම්කාරිය .................................................... දින මා ඉදිරිපිටදී මෙහි අත්සන් තබන ලද බව ද ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය ................................. බව ද උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ/ඇයගේ උපන් දිනය ....................................... බව ද අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15 ට වැඩි බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :- ................................................................................
තාරාතිරම :- .................................................................................................................
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)

ලිපිනය :- .......................................................................................................................

දිනය : - ..................................... ..........................................................................
අත්සන සහතික කරන අයගේ අත්සන.

***සැලකිය යුතුයි*** - (අයදුම්කරුගේ අත්සන අනුමත පාසලක ප්‍රධානියකු, ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයකු විසින් හෝ සහතික කළ හැකිය.)

ඇමුණුම 02

**ජාතික සංගීත විභාගය - 2024**

සංගීත - විෂය ලේඛනය හා විෂය අංක

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| *(අ) ප්‍රධාන විෂයය* | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
| ගායනය | 160 | 260 | 360 |
| ස්වර වාදනය | | | |
| වයලීන් | 171 | 271 | 371 |
| එස්රාජ් | 172 | 272 | 372 |
| සරෝද් | 174 | 274 | 374 |
| සිතාර් | 175 | 275 | 375 |
| බටනලා | 176 | 276 | 376 |

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| *(අ) ප්‍රධාන විෂයය* | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
| සාරංගි | 177 | 277 | 377 |
| ගිටාර් | 178 | 278 | 378 |
| තාල වාදනය | | | |
| තබ්ලා | 190 | 290 | 390 |

| | | | |
|---|---|---|---|
| (ආ) (අනු විෂයය) | | | |
| ගායනය | 161 | 261 | 361 |
| ස්වර වාදනය | | | |
| වයලීන් | 181 | 281 | 381 |
| එස්රාජ් | 182 | 282 | 382 |
| සරෝද් | 184 | 284 | 384 |
| සිතාර් | 185 | 285 | 385 |
| බටනලා | 186 | 286 | 386 |
| සාරංගි | 187 | 287 | 387 |
| ගිටාර් | 188 | 288 | 388 |
| තාල වාදනය | | | |
| තබ්ලා | 191 | 291 | 391 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | 001 | | |

- ප්‍රධාන විෂයය හා සමානවන ලෙස අනුවිෂයය තෝරා ගත නොහැකිය.

උදා:- I. ප්‍රධාන විෂයය "ගායනය" හා අනුවිෂයය "ගායනය"
II. ප්‍රධාන විෂයය වාදනය "වයලීනය" හා අනුවිෂයය වාදනය "වයලීනය" ආදී වශයෙනි.

10-165